**ලංකා සතොස ලිමිටඩ් - 2018/2019**

**----------------------------------------------------**

ලංකා සතොස ලිමිටඩ් සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දැක්විය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වග බලා ගනු ලැබිය යුතුය.

**1.2** **මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම**

**----------------------------------------------------------**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 වගන්තිය ප්‍රකාරව, සමාගම්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2007 අංක 07 දරණ සමාගම් පනතේ 150 (1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස හයක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.

## 2.1 සංවිධානයේ අඛන්ඩ පැවැත්ම

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආනයනික සහල් තොග හානි ඇතුළුව තොග සම්බන්ධයෙන් වූ අලාභ හේතුවෙන් 2014 වර්ෂයේ සිට ස්කන්ධය රු.10,929,943,402 හා සෘණ අගයක් බවට පත්වී තිබූ අතර ස්කන්ධයේ පවතින අහිතකර තත්ත්වයත් ජංගම වත්කම් ඉක්මවූ ජංගම බැරකම් පැවතීමත් නිසා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීමෙන් තොරව සමාගමේ අඛන්ඩ පැවැත්ම සම්බන්ධයෙන් අවිනිශ්චිත තත්ත්වයක් පැවතුණි. | **කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි.** | විගණන නිරීක්ෂණයන්හි පෙන්වා දී ඇති කරුණු කෙරෙහි අවධානය යොමුකර අදාළ තත්ත්වයන් මඟහරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ඈදියට අනුකූල නොවීම

---

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1 සහ 3.2 වගන්ති | චක්‍රලේඛයට පටහැනිව, සමාගමේ සභාපතිවරයා සඳහා අනුයුක්ත කර තිබූ වාහනය සඳහා අනුමත සීමාව ඉක්මවා 2018, 2019 වර්ෂ සඳහා පිළිවෙලින් රු. 88,589 ක් සහ රු.81,760 ක් වශයෙන් ඉන්ධන වියදම් දරා තිබූ අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය සහිතව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සමාගමේ බැංකු ගිණුම් 10 ක් සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශ මාසිකව පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |

## 2.4 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ, පිරිවැය රු.5,400,000 ක් සහ රු.13,300,000 ක් වූ සමාගම සතු වාහන දෙකක් විධිමත් පරිදි භාර දීමකින් තොරව ධාවනයට නුසුදුසු තත්ත්වයෙන් සමාගම් පරිශ්‍රය වෙත ගෙනවිත් දමා තිබූ අතර, ඉන් රු. 5,400,000 ක් වටිනා වාහනය මෙම වාර්තාවේ දිනය වන විටත් ධාවනයට නුසුදුසු තත්ත්වයෙන් නිශ්කාර්යව පැවතුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | නිෂ්කාර්යව පවතින වාහනය සමාගමට ඵලදායී වන ආකාරයට අළුත්වැඩියා කර පරිහරණයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාගම සතු වාහන තුනක් සහ මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ මිලදී ගෙන, සභාපතිවරයා විසින් භාවිතා කරන ලද වාහන දෙකක් සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන සඳහා ධාවන සටහන් පවත්වා ගෙන ගොස් නොමැත. | වාහන සම්බන්ධයෙන් ධාවන සටහන් හා මාසික සාරාංශ පවත්වාගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ නව අලෙවිසැල් විවෘත කිරීම, වේලා සටහන් යන්ත්‍ර සවි කිරීම, පවතින අලෙවිසැල් වැඩිදියුණු කිරීම, ආරක්ෂිත කැමරා පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ වරලත් අලෙවිසැල් විවෘත කිරීම යන ප්‍රාග්ධන කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් රු.මිලියන 500 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ඉන් රු. මිලියන 438.7 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අතුරින් වේලා සටහන් යන්ත්‍ර සවි කිරීම සඳහා වෙන් වූ රු. මිලියන 15 කින් රු. මිලියන 12.3 ක ප්‍රතිපාදන වැය කර සියයට 100 ක ප්‍රගතියක් ලබා ගෙන තිබූ අතර ආරක්ෂිත කැමරා පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර තිබූ රු. මිලියන 80 න් රු. මිලියන 48 ක් වැය කර සියයට 71 ක ප්‍රගතියක් ලබා ගෙන තිබුණි. එසේ වුවද නව අලෙවිසැල් විවෘත කිරීම සඳහා වෙන් කර තිබූ රු. මිලියන 150 ට අමතරව රු. මිලියන 126.1 ක් වැය කර තිබුණද සියයට 26 ක ප්‍රගතියක් පමණක් ලබා ගෙන තිබුණි. එමෙන්ම පවතින අලෙවිසැල් වැඩිදියුණු කිරීම සහ වරලත් අලෙවිසැල් විවෘත කිරීම යන ප්‍රාග්ධන කාර්යයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 118 ක සහ රු.මිලියන 27ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම කාර්යයන් ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | කළමනාකාරිත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | භාණ්ඩාගාරය විසින් සපයනු ලබන ප්‍රතිපාදන, උපරිම ඵලදායිත්වයෙන් යුතුව උපයෝජනය කල යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පෞද්ගලික අංශයේ සමාගමකට පවරා තිබූ සමාගමේ තොග කළමනාකරණ ක්‍රියාවලියට අදාලව කෙරවලපිටිය තොග ගබඩාවේ මෙහෙයුම් කටයුතු 2019 ජූනි මාසයේ සිට නවතා දමා තිබුණද විගණන දිනය වූ 2019 ඔක්තෝබර් 02 දින වන විට රු. 42,764,243 ක් වටිනා ග්‍රොසරි භාණ්ඩ තොග එම ගබඩාවේ පැවතුණි. එම භාණ්ඩ තොගය, බෙදාහැරීමට සුදුසු, කෙටි කාලයකින් කල් ඉකුත් වන, අලෙවිසැල්වලින් ආපසු හරවා එවන ලද | කළමනාකාරිත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | තොග සම්බන්ධ අලාභ, අදාල පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

වශයෙන් වර්ග කර තිබූ අතර එහි වටිනාකම් පිළිවෙලින් රු.4.369,485 ක්, රු.18,744,895ක් සහ රු.19,649,861ක් විය. අදාල තොග කළමනාකරණ කටයුතු සමාගම විසින් විධිමත් පරිදි අධීක්ෂණය නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගතව තිබුණි.

## 2.6 වෙනත් සංවිධානවලට මුදාහල සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව සමාගමේ වාහනයක් රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර එහි ඉන්ධන සහ නඩත්තු වියදම් වශයෙන් රු. 346,704 ක් සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණද එම වියදම ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම වෙනුවෙන් ආරක්ෂක සේවා සපයනු ලබන සමාගමක් වෙත ගෙවනු ලබන ගාස්තුවට අමතරව, අදාල සමාගම විසින් ලංකා සතොස සමාගම වෙත අනුයුක්ත කරන ලද උපදේශකවරයෙකුට ගෙවන ලද ගාස්තු සහ දීමනා, විධිමත් අනුමැතියකින් තොරව එම සමාගම වෙත ප්‍රතිපූරණය කර තිබු අතර එම නිලධාරියාට සමාගමේ වාහන භාවිතා කිරීමටද අවස්ථාව සලසා දී තිබුණි. උක්ත සඳහන් ආකාරයට, 2018 ජූනි සිට 2019 සැප්තැම්බර් දක්වා මාසිකව රු.65,000 බැගින් ප්‍රතිපූරණය කර තිබූ මුදල රු.1,040,000 ක් විය. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව ලබා ගන්නා සේවාවලට අමතරව ගෙවනු ලබන ගාස්තු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. |

## 2.8 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය 4,246 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ තත්‍ය කාර්ය මණ්ඩලය 3,859 ක් වූ අතර කාර්ය මණ්ඩලයේ 990 ක ඌනතාවයක් ද 603 ක අතිරික්තයක් ද පැවතුණි. අලෙවිසැල් වර්ධනයවීමත් සමඟ ඊට අනුරූපව අනුමත කරවා ගෙන තිබූ තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කර තිබුණද අලෙවිසැල්වල තනතුරුවලට අදාල උසස්වීම් ප්‍රමාදවීම, කාර්ය මණ්ඩල අතිරික්තයන් සහ ඌනතාවයන් කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවී තිබූ බව නිරීක්ෂණය විය. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි | අනුමත කාර්ය මණ්ඩලය අනුව බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේදී පිළියෙල කර තිබූ සමාගමේ බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණද එම බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගැනීම් සිදු කර තිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරවා ගත යුතුය. |
| (ඇ) | ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු කළමනාකරණ මට්ටමේ නිලධාරීන් හය දෙනෙකු විසින් ඉදිරිපත් කර තිබූ ව්‍යාජ අධ්‍යාපන සහ වෘත්තීය සහතික සත්‍ය ඒවා බවට සහතික කර ගැනීමෙන් තොරව බඳවා ගැනීම් සහ උසස් කිරීම් සිදු කර තිබුණි. ඒ බව අනාවරණය කර ගැනීමෙන් පසු එම නිලධාරීන්ගේ සේවය අත්හිටුවා පරීක්ෂණ කටයුතු ආරම්භ කර තිබුණද මෙම වාර්තාවේ දිනය වන විටත් එම පරීක්ෂණ අවසන් කිරීමට හා අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. අදාල කාලසීමාව තුළ එම නිලධාරීන්ගේ වැටුප් හා දීමනා වශයෙන් සමාගම විසින් ගෙවා තිබූ මුදල රු.23,143,170 ක් විය. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි | අදාල පාර්ශවයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.9 ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණ | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය | | | |
| (i) | රු.198,175,784 ක මුදලකට ප්‍රදානය කර තිබූ මෙම ව්‍යාපෘතිය මාස 15 ක් ඇතුළත අවසන් කළ යුතු වුවත් එම කාලසීමාව විධිමත් අනුමැතියකින් තොරව දීර්ඝ කර තිබූ අතර මෙම වාර්තාවේ දිනය වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කල යුතුය. |
| (ii) | ව්‍යාපෘතියේ ඇතැම් කටයුතු නිසියාකාරව සිදු නොකිරීම හේතුවෙන් සමාගමේ තොරතුරු තාක්ෂණ අංශය විසින් එම කාර්යයන් සිදු කර තිබූ අතර ව්‍යාපෘතිය ආරම්භ කර මාස 29 ක් ගතවී තිබුණද ව්‍යාපෘතිය නිම කර නොතිබියදී කොන්ත්‍රාත් මුදලින් 30% ක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට කටයුතු කර තිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ කටයුතු නිම කළ පසු අදාල මුදල් ගෙවිය යුතුය. |
| (iii) | ගිවිසුම අනුව ගැණුම්කරුගේ ලිඛිත එකඟතාවයකින් තොරව කොන්ත්‍රාත්තුව හෝ එහි කොටසක් හෝ වෙනත් පාර්ශවයකට පැවරීමෙන් සිදු වන හානි හෝ පාඩු සම්බන්ධයෙන්,කොන්ත්‍රාත්කරු අදාල කොන්ත්‍රාත් වටිනාකමින් 1% ක අගයට සමානව වගකීමට බැඳේ. එසේ වුවද ඇතැම් කොටස් වෙනත් ආයතනයකට පැවරීම හේතුවෙන් ප්‍රමාද වී තිබූ කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 1% ක් වූ රු. 19,817,578 ක මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | කොන්ත්‍රාත්තුව නිම කර භාර දීමට ප්‍රමාද වුවහොත් කොන්ත්‍රාත් මුදලින් 1% ක් අඩු කළ යුතු බව සඳහන් වුවද, ප්‍රමාද වන එක් දිනකට ගෙවිය යුතු ගාස්තුව නිශ්චය කර නොතිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත්තුව නිම කළ යුතු දිනය ඉක්මවා දින 574 ක් ප්‍රමාදවී තිබියදී කොන්ත්‍රාත් මුදලින් 1% ක් පමණක් අඩු කර උක්ත (ii) හි සඳහන් පරිදි මුදල් ගෙවීම් සිදු කර තිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි | ප්‍රමාද වූ දින ගණන අනුව ප්‍රමාද ගාස්තු අය කර ගත යුතුය. |

## 2.10 ප්‍රසම්පාදන කළමනාකරණය

-------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | -------------------- | ----------- |
| (අ) | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 3.2 ප්‍රකාරව ජාතික කරගකාරී ලංසු කැඳවීමෙන් තොරව, එකම සැපයුම්කරුවෙකුගෙන්, මිල ගණන් දෙකකට ප්ලාස්ටික් ඇසුරුම් කූඩ 12,800 ක් මිලදී ගැනීමට අවස්ථා තුනකදී කටයුතු කර තිබූ අතර එහි වටිනාකම රු. 24,382,509 ක් විය. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | මෙම මිලදී ගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.4 ප්‍රකාරව සිදු කර නොතිබූ අතර විධිමත් පරිදි අදාල නිර්දේශ සහ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබූ මෙම ඇසුරුම් කූඩ 12,800 න් කූඩ 7824 ක් ගබඩාවල පැවති බව 2019 ජනවාරි 02 දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර එම කූඩවලින් 1975 ක් 2019 වර්ෂය අවසාන වන විටත් ගබඩාවල නිශ්කාර්යව පැවතුණි. මිල ගණන් දෙකකට මිලදී ගෙන තිබූ කූඩයක අවම මිල වූ රු.1,904.48 බැගින් තක්සේරු කළ විට නිශ්කාර්යව පැවති කූඩවල වටිනාකම රු. 3,761,348 ක් විය. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි | නිසි අධ්‍යානයන් කර අවශ්‍යතාවයන්ට සරිලන ලෙස මිලදී ගැනීම් සිදුකල යුතුය. |

## 3. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදයේ 1 වන වගන්තිය ප්‍රකාරව ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උක්ත සඳහන් චක්‍රලේඛයේ 5 ඡේදයේ 2 වන වගන්තිය ප්‍රකාරව, ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.3 විගණන කමිටුව**

**------------------**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| **----------------------** | **---------------------** | **-----------** |
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව, විගණන සහ කළමනාකරණ කමිටුව අවම වශයෙන් මාස තුනකට එක් වරක්වත් රැස්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ විගණන කමිටුව දෙවරක් පමණක් රැස්වී තිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |